මාධ්‍ය තුළ නැරඹීමට යමෙකුට අසීරු විය හැකි ආකාරයේ සංවේදී ඡායාරූප පළ කිරීමේ ගැටළුව අපි නැවත නැවතත් කථාබහට ගෙන ඇත්තෙමු. මෙහිදී අප සංවාදයට ලක් කරනා අදහස වන්නේ, නැරඹීමට යම් අයෙකුට අපහසු විය හැකි මට්ටමේ සංවේදී, ලේ වැකුණු ඡායාරූප පළ කිරීමෙන් ලිපියේ සමස්ත චිත්‍රයට දායකත්වයක් නොලැබෙන්නේ නම්, එවැනි ඡායාරූපයක් පළ නොකිරීම මගින් ලිපියේ අන්තර්ගතයට හෝ ඉන් ඉදිරිපත් කරනා කාරණයට හානියක් නොවන්නේ නම් එවැනි ඡායාරූප පළ කිරීම අවශ්‍යද යන්නයි.
ප්‍රචණ්ඩත්වය පිළිබඳ කරුණු වාර්තා කිරීමේදී ඊට සම්බන්ධ ඡායාරූප, අවශ්‍ය සංවේදීතාවෙන් හා විචාර බුද්ධියෙන් යුතුව මෙන්ම, පොදුජන යහපත උදෙසා කරුණු ප්‍රකාශයට පත් කිරීම පිළිබඳ තමන්ගේ වගකීමට යටත්වද ඉදිරිපත් කිරීමට පුවත්පත විශේෂයෙන් සැලැකිලිමත් විය යුත්තේය යනුවෙන් මාධ්‍ය ආචාර ධර්ම මාර්ගෝපදේශයන්හිද දැක්වෙන බව මෙහිදී සිහි තබාගත යුතුයි.
කෙසේ නමුත්, මේ දිනවල පාතාල ක්‍රියාකාරකම් වලට සැක සහිතව පොලිස් භාරයේ පසුවන රැඳවියන් පොලිස් වෙඩි පහරින් මරණයට පත්වූ බවට පැවසෙන පුවත් විශේෂාංග සමගින් මෙවැනි සංවේදී, ලේ වැකුණු ඡායාරූප පළ වීමේ ප්‍රවණතාවයක් දැකීමට ලැබේ. "මරුවා සමග වාසයට ගිය ඌරු ජුවා" යන සිරස්තලයෙන් දිවයින (05/13) පුවත්පතේ පළවී ඇති ලිපිය තුළ අඩංගු ඡායාරූපය ඊට නිදසුනකි.
මේ සම්බන්ධයෙන් ඔබේ අදහස කුමක්ද?
මීට අදාළ අපගේ පෙර පෝස්ටුවට සබැඳිය:
**https://www.facebook.com/ethicseye/posts/1419341501754236**
#MediaEthicsSL #lka #SinhalaPress #Divaina